**අධ්‍යයන පොදු සහතික පත්‍ර ( උසස් පෙළ ) උපකාරක සම්මන්ත්‍රණ මාලාව - 2013**
**පුනරීක්ෂණ ප්‍රශ්න පත්‍රය.**

## ආර්ථික විද්‍යාව I

සියලුම හිමිකම් ඇවිරිණි

**බහුවරණ ප්‍රශ්ණ පත්‍රයේ පිළිතුරු.**

| | | | | |
|---|---|---|---|---|
| **01 – 4.** | **11 – 2.** | **21 – 5.** | **31 – 5.** | **41 – 1.** |
| **02 – 5.** | **12 – 3.** | **22 – 1.** | **32 – 4.** | **42 – 2.** |
| **03 – 4.** | **13 – 4.** | **23 – 4.** | **33 – 4.** | **43 – 1.** |
| **04 – 1.** | **14 – 2.** | **24 – 3.** | **34 – 2.** | **44 – 2.** |
| **05 – 5.** | **15 – 4.** | **25 – 2.** | **35 – 4.** | **45 - 5.** |
| **06 – 1.** | **16 – 3.** | **26 – 5.** | **36 – 4.** | **46 – 4.** |
| **07 –3.** | **17 – 4.** | **27 – 2.** | **37 – 5.** | **47 – 3.** |
| **08 – 5.** | **18 – 5.** | **28 – 5.** | **38 – 3.** | **48 – 3.** |
| **09 – 2.** | **19 – 3.** | **29 – 3.** | **39 – 1.** | **49 – 1** |
| **10 – 1.** | **20 – 4.** | **30 – 1.** | **40 – 2.** | **50 – 5.** |

**අධ්‍යයන පොදු සහතික පත්‍ර ( උසස් පෙළ ) උපකාරක සම්මන්ත්‍රණ මාලාව - 2013**
**පුනරීක්ෂණ ප්‍රශ්න පත්‍රය.**

# ආර්ථික විද්‍යාව II

**ආදර්ශ පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය.**

සියලුම හිමිකම් ඇවිරිණි

1. (i) (අ) භූමිය.
(ආ) ප්‍රාග්ධනය.
(ඇ) ශ්‍රමය.
(ඇ) ව්‍යවසායකත්වය. (ලකුණු 04)

(ii) (අ)




(ලකුණු 02)

(ආ) සම්පත් හි ස්වභාවය වන්නේ ඒවා සමජාතිය නොවන බවය.

- කාර්මික භාණ්ඩ නිපදවීම සඳහා යොදාගන්නා සම්පත් එම ඵලදායීතාවයෙන්ම කෘෂිකාර්මික භාණ්ඩ නිපදවීම සඳහා යොදාගත නොහැකි බවයි.
- නිෂ්පාදන ශිල්ප ක්‍රම එකිනෙකට වෙනස් වේ. කාර්මික භාණ්ඩ නිපදවීමට යොදාගන්නා ශිල්ප ක්‍රමය ඒ අයුරින්ම කෘෂිකාර්මික භාණ්ඩ නිපදවීමට යොදාගත නොහැකි බවයි.

(කරුණු දෙකට ලකුණු 02)

(ඉ) කාර්මික භාණ්ඩ 30 ක් නිපදවන විට කෘෂිකාර්මික භාණ්ඩ නිපදවිය හැක්කේ 70 ක් පමණි. කාර්මික භාණ්ඩ 30 ක හා කෘෂිකාර්මික භාණ්ඩ 85 ක සංයෝගයක් දැනට නිපදවිය නොහැක. ඊට බලපාන හේතුව සම්පත් හිඟකමයි.




(ඊ) නැත. නිෂ්පාදන ධාරිතාව ඉහළ ගිය විට නිපදවිය හැකි භාණ්ඩ ප්‍රමාණය යම් මට්ටමකින් ඉහළ යා හැකි නමුත් ඊට සාපේක්ෂව මිනිස් වුවමනා වඩාත් වේගයෙන් වර්ධනය වේ. එසේ වර්ධනය වූ මිනිස් වුවමනා සපුරා ගැනීමට තරම් සම්පත් ප්‍රමාණවත් නොවීම නිසා හිඟකම පිළිබඳ ප්‍රශ්නය තවදුරටත් නොවිසඳී පවතිනු ඇත. (ලකුණු 02)

(iii) සංඥා නිකුත් කිරීම.
සලාකකරණය.
සානුබල සැපයීම. (ලකුණු 03)

(iv) ස්වාර්ථය අරමුණින් කටයුතු කරන වෙළෙඳපොළ ආර්ථිකය, හැමවිටම මිල යාන්ත්‍රණයේ මඟපෙන්වීමට අනුව පිරිවැය අවම වන ශිල්ප ක්‍රමයක් තෝරා ගනී. එහි දී සාපේක්ෂ සාධක මිල සැලකිල්ලට ගනිමින් සාධක මිශ්‍රණය පිළිබඳ තීරණ ගනී.

සමාජ ශුභ සාධන අරමුණින් කටයුතු කරන සැලසුම් ආර්ථිකයන්, සැලසුම් යාන්ත්‍රණයේ මඟ පෙන්වීම අනුව නිෂ්පාදන ශිල්ප ක්‍රමය තෝරා ගනී. මෙහි දී ආර්ථිකයේ සේවා වියුක්ති අනුපාතිකය, නිෂ්පාදන පිරිවැය, අනාගතයට සම්පත් වෙන් කිරීම, ආදී සාධක සැලකිල්ලට ගෙන සමාජ ශුභ සාධනය උපරිම කරන ශිල්ප ක්‍රමය තෝරාගනු ලබයි.

මිශ්‍ර ආර්ථිකයක පුද්ගලික අංශය වෙළෙඳපොළ බලවේග අනුව ද රාජ්‍ය අංශය රාජ්‍ය සැලසුම් ක්‍රියාවලිය අනුව ද නිෂ්පාදන ශිල්ප ක්‍රමය තෝරා ගැනීමේ ගැටලුවට විසඳුම් සොයයි.
(ලකුණු 03)

(v) වෙළෙඳපොළ ආර්ථික පද්ධතියක් අකාර්යක්ෂම වන්නේ පහත අවස්ථාවන් හීදිය,
1. සම්පත් බෙදාහැරීම අකාර්ක්ෂම වීම. / වෙළෙඳපොළ අසමත් වීම.
2. ආර්ථික අසමානතා / ආදායම් බෙදියාමේ විෂමතා.
3. ආර්ථික අස්ථායීතා ඇති වීම. (ලකුණු 02)

(2).(i) දෙන ලද නිශ්චිත අවස්ථාවක සැපයුම කෙරෙහි බලපාන අනිකුත් සාධක ස්ථාවරව තිබිය දී සලකා බලන භාණ්ඩයේ මිලත් සැපයුම් ප්‍රමාණයත් අතර අනුලෝම සම්බන්ධයක් පවතින බව විග්‍රහ කිරීම සැපයුම් නීතිය මඟින් සිදුවේ. (ලකුණු 02)

සැපයුම් වක්‍රය ඉහළට බෑවුම් වන්නේ,

- වැඩිවන ආවස්ථික පිරිවැය නීතිය නිසාය - සැපයුම් ප්‍රමාණය වැඩිකරන විට ආන්තික පිරිවැය ඉහළ යයි. එම නිසා සැපයුම් ප්‍රමාණය වැඩිකිරීමට හැකිවන්නේ වැඩි වන මිල ගණන් යටතේ ය .

(එක් කරුණකට ලකුණු 01 බැගින් ලකුණු 02)

(ii) <u>මිල රු. 10 දී සැපයුම් ප්‍රමාණය</u>

අධි සැපයුම් ප්‍රමාණය = සැපයුම් ප්‍රමාණය - ඉල්ලුම් ප්‍රමාණය
-1000 = සැපයුම් ප්‍රමාණය - 1000
- 1000 + 1000 = සැපයුම් ප්‍රමාණය
0 = සැපයුම් ප්‍රමාණය

<u>මිල රු. 40 දී සැපයුම් ප්‍රමාණය</u>

අධි සැපයුම් ප්‍රමාණය = සැපයුම් ප්‍රමාණය - ඉල්ලුම් ප්‍රමාණය
200 = සැපයුම් ප්‍රමාණය - 400
200 + 400 = සැපයුම් ප්‍රමාණය
600 = සැපයුම් ප්‍රමාණය




(අ) සමතුලිත මිල රු. **35**
සමතුලිත ප්‍රමාණය ඒකක **500** (ලකුණු 01 බැගින් 02 යි)

(ආ) සහනාධාරයේ ප්‍රමාණයෙන් සැපයුම් වක්‍රය S සිට $S_1$ දක්වා දකුණට විතැන් වේ.
(I) නව සමතුලිත මිල රු **30**, සමතුලිත ප්‍රමාණය ඒකක **600** (ලකුණු 02 යි)

(II) සහනාධාරයට පෙර පාරිභෝගික අතිරික්තය } = $\frac{(\text{උපරිම ඉල්ලුම් මිල - සමතුලිත මිල})\ \text{සමතුලිත ප්‍රමාණය}}{2}$

$= \frac{(60 - 35)\ 500}{2}$

$= 6250$ (ලකුණු 01)

සහනාධාරයට පසු පාරිභෝගික අතිරික්තය } $= \frac{(60 – 30)\ 600}{2}$

$= 9000$ (ලකුණු 01)

(III) සහනාධාරයට පෙර නිෂ්පාදන අතිරික්තය } = (නිෂ්පාදකයාට ලැබෙන මිල - අවම සැපයුම් මිල) සමතුලිත ප්‍රමාණය / **2**

= (35 – 10) 500 / 2

= 6250 (ලකුණු 01)

සහනාධාරයට පසු නිෂ්පාදන අතිරික්තය } = (40 - 10) 600 / 2

= 9000 (ලකුණු 01)

(iv) සහනාධාරය සඳහා රජය දරන වියදම = ඒකක සහනාධාරය x අලෙවිකරණ ප්‍රමාණය

10 x 600

= 6000 (ලකුණු 01)

(v) සහනාධාරය නිසා අහිමි වන සමාජ ශුභසාධනය } = සහනාධාරය සඳහා රජය දරන වියදම – වැඩි වූ ආර්ථික අතිරික්තය

= 6000 – 5500

= 500 (ලකුණු 01)

(iii) මිල ඉල්ලුම් නම්‍යතාව තීරණය කරන සාධක

- සලකා බලන භාණ්ඩය සඳහා ඇති ආදේශන ප්‍රමාණය.
- සලකා බලන භාණ්ඩයෙන් ලැබෙන ප්‍රයෝජන සංඛ්‍යාව.
- සලකා බලන භාණ්ඩය නිර්වචනය කොට ඇති ආකාරය.
- සලකා බලන භාණ්ඩය සඳහා ආදායමෙන් වැයකරන ප්‍රතිශතය.
- සලකා බලන භාණ්ඩය අත්‍යවශ්‍ය ද / අත්‍යවශ්‍ය නොවේ ද යන්න.
- සලකා බලන භාණ්ඩයේ මිල වෙනස්වීමෙන් පසු ගතවී ඇති කාලය.

(එක් කරුණකට ලකුණු 01 බැගින් ලකුණු 03යි.)

(iv) සාධක විකිණීමෙන් ලැබෙන ආදායම තුළ සාධක ඉපැයුම් වර්ග දෙකක් අන්තර්ගත වේ.

- සංක්‍රාම ඉපැයුම් - පවත්නා භාවිතය තුළ තවදුරටත් සාධක යෙදවීම් සඳහා සාධක හිමියා අපේක්ෂා කරන අවම සාධක ඉපැයීම් ප්‍රමාණය.
- ආර්ථික බදුකුලිය - සංක්‍රාම ඉපැයුම් ප්‍රමාණය ඉක්මවා ලබන සාධක ආදායම් ප්‍රමාණය.

(ලකුණු 01)

ආර්ථික බදුකුලියේ ප්‍රමාණය, සාධක සැපයුම් නම්‍යතාවය මත තීරණය වේ.

සාධක සැපයුම පූර්ණ නම්‍ය වේ නම් සාධක අලෙවියෙන් ලැබෙන මුළු අයභාරය ම සංක්‍රාම ඉපයුම් වේ.

සාධක සැපයුම පූර්ණ අනම්‍ය නම් සාධක අලෙවියෙන් ලැබෙන මුළු අයභාරය ම ආර්ථික බදු කුලිය වේ.







(ලකුණු 02)

(3). (i) හීනවන ඵල යනු,

කෙටිකාලීන නිෂ්පාදන ක්‍රියාවලියක ස්ථාවර යෙදවුම් සමඟ සංයෝග කරන විචල්‍ය යෙදවුමෙ හි ආන්තික නිෂ්පාදිතය හා සාමාන්‍ය නිෂ්පාදිතය යම් මට්ටමකට පසු පහළ යාම වේ.

(ලකුණු 02)

අඩුවන පරිමාණානුකූල ඵල යනු,

දිගු කාලයේ දී නිෂ්පාදන ක්‍රියාවලිය තුළ සියලුම යෙදවුම් කිසියම් ප්‍රතිශතයකින් වැඩි කරන විට ඊට වඩා අඩු ප්‍රතිශතයකින් නිමවුම ඉහළ යාම වේ. (ලකුණු 02)

(ii) (අ) ගණකාධිකරන ලාභය යනු, මුළු ආදායමෙන් ඍජු පිරිවැය පමණක් අඩුකළ පසු ලැබෙන අගයයි.

ගණකාධිකරන ලාභය = මුළු ආදායම - ඍජු පිරිවැය (ලකුණු 01)

ආර්ථික ලාභය යනු, මුළු ආදායමෙන් ඍජු හා වක්‍ර පිරිවැය අඩුකළ පසු ලැබෙන අගයයි.

ආර්ථික ලාභය = මුළු ආදායම - ( ඍජු පිරිවැය + වක්‍ර පිරිවැය )

ගණකාධිකරන ලාභයෙන් ආර්ථික ලාභය වෙනස්වන්නේ වක්‍ර පිරිවැය නිසාය. (ලකුණු 01)

(ආ) ප්‍රාමාණික ලාභය යනු ව්‍යවසායකයෙකු නිෂ්පාදන ක්‍රියාවලිය තුළ නිරත වෙමින් එනම් නිෂ්පාදන ක්‍රියාවලිය සංවිධානය කිරීම හා අවදානම් දැරීම වෙනුවෙන් උපයා ගැනීමට අපේක්ෂා කරනු ලබන අවම හෝ සාමාන්‍ය ලාභය යි.

ආර්ථික විද්‍යාවේ දී නිෂ්පාදන පිරිවැය ලෙස සලකනු ලබන්නේ නිෂ්පාදන ක්‍රියාවලිය තුළ දරනු ලබන මුළු ආවස්ථික පිරිවැය යි.

ප්‍රාමාණික ලාභය ආවස්ථික පිරිවැයක් වන බැවින් එය නිෂ්පාදන පිරිවැය තුළ අන්තර්ගත විය යුතුයි. (ලකුණු 03)

(iii) සලකනු ලබයි.

අතිතයේ දි දරන ලද පිරිවැය වර්තමානයේ දී ආපසු ලබාගත නොහැකි නම් එබඳු පිරිවැය යටකල හෙවත් ගිලුණු පිරිවැය ලෙස හැඳින් වේ. (ලකුණු 01)

නිෂ්පාදන ක්‍රියාවලියක ස්ථාවර වත්කම් මිලට ගැනීම සම්බන්ධයෙන් පිරිවැය දරන අවස්ථාවේ දී ආවස්ථික පිරිවැයක් පැවතුන ද පිරිවැය දැරීමෙන් අනතුරුව මිල දී ගත් වත්කම් සම්බන්ධයෙන් ආවස්ථික පිරිවැයක් නොපවතී. එම නිසා එවැනි පිරිවැය නිෂ්පාදන ක්‍රියාවලියේ පිරිවැය තුළට අන්තර්ගත නොකෙරේ. නමුත් ස්ථාවර වත්කම් භාවිතය සම්බන්ධ ක්ෂය වීම්, ඍජු පිරිවැය ලෙස ද ආර්ථික ක්ෂයවීම්, වක්‍ර පිරිවැය ලෙස ද නිෂ්පාදන පිරිවැයට අන්තර්ගත කරයි. (ලකුණු 02)

(iv) (අ)

| ඒකාධිකාරි වෙළෙඳපොළ | කතිපයාධිකාරි වෙළෙඳපොළ |
|---|---|
| 1. එක් සැපයුම්කරුවෙක් සිටීම. / කර්මාන්තය හා ආයතනය එකක් වීම. | 1. සැපයුම්කරුවන් අතලොස්සක් සිටීම. |
| 2. සුවිශේෂි භාණ්ඩ නිපදවීම. | 2. ප්‍රභේදිත භාණ්ඩ හෝ සමජාතිය භාණ්ඩ නිපදවීම. |
| 3. ස්වාධීනව මිල තීරනය කිරීම. / මිල තීරකයෙකු වීම. | 3. අන්‍යෝන්‍ය වශයෙන් මිල තීරණය කිරීම හා මිල දැඩිබව. |
| 4. හඳුන්වාදීමට පමණක් සීමා වූ ප්‍රචාරණයක් කිරීම. | 4. තරගකාරිව ප්‍රබල ලෙස ප්‍රචාරණය කිරීම. |

(ලකුණු 04)

(ආ)




පූර්ණ තරගකාරි ආයතනයක් කෙටි කාලයක් තුළ නිෂ්පාදනයේ නිරත වෙනවා ද නැද්ද යන්න තීරණය කරනු ලබන්නේ භාණ්ඩයේ වෙළෙඳපොළ මිල අවම සාමාන්‍ය විචල්‍ය පිරිවැයට සමාන හෝ ඊට ඉහළ මිලක් ද නැතිනම් ඊට පහළ මිලක් ද යන්න මතය. ඉහත රූප සටහනේ A ලක්ෂ්‍යයට අදාළ $P_1$ මිලෙන් එය දැක්වේ. $P_1$ මිලට අඩු මිලක් වෙළෙඳපොළේ පවතී නම් ආයතනය නිෂ්පාදනය අත්හිටුවයි.
(ලකුණු 02)

පූර්ණ තරගකාරි ආයතනයේ කෙටි කාලීන සැපයුම් වක්‍රය ලෙස සලකනු ලබන්නේ AVC වක්‍රයේ අවම ලක්ෂ්‍යයේ පටන් ඉහළට ගමන් කරන ආන්තික පිරිවැය රේඛා ඛණ්ඩයයි. එය රූප සටහනේ MC වක්‍රයේ AB මගින් දැක්වේ. (ලකුණු 02)

(4). (I) (අ)

ජාතික ආදායම = ශුද්ධ පොලිය + ශ්‍රමික ඉපැයුම් + සමාගම් ලාභ + බදුකුලී ආදායම + වි.ශු.සා.ආ
= 200 + 1000 + (60 + 40 + 50) + 300 + (50 - 100)
= 1600

(ආ)

ශුද්ධ දේශීය නිෂ්. = ශුද්ධ පොලි + ශ්‍රමික ඉපැයුම් + සමාගම් ලාභ + බදුකුලී ආදායම + ශු. වක්‍ර බදු
= 200 + 1000 + (60 + 40 + 50) + 300 + 200
= 1850

(ඇ)

ක්ෂයවීම් = ද. දේ. නිෂ්. - ශු.දේ.නිෂ්.
= 1900 – 1850
= 50

දළ ජා. නිෂ්. = ජාතික ආදායම + ශු. වක්‍ර බදු + ක්ෂයවීම්
දළ ජා. නිෂ්. = 1600 + 200 + 50
= 1850

(ඈ)

වැය කළ හැකි කුටුම්භ ආදායම = ජාතික ආදායම + කුටුම්භ සංක්‍රාම - (කුටුම්භ වෙත නොලැබෙන ආදායම් + පෞද්ගලික බදු)
= 1600 + 300 – (40+50+250+100)
= 1460

(ඉ)

ජාතික ඉතුරුම් = දළ ආයෝජන + ශුද්ධ අපනයන + වි.ශු.සා.ආ. + වි.ශු.වර්තන සංක්‍රාම
= 300 + 200 + (-50) + 70
= 520

(ගණනය කිරීම් සඳහා විකල්ප ක්‍රම භාවිත කළ හැක.)
(ලකුණු 10)

(II) (අ) විදේශීය ශුද්ධ සාධක ආදායම සෘණ අගයක් ගැනීම නිසා දළ දේශීය නිෂ්පාදනයට වඩා දළ ජාතික නිෂ්පාදනය අඩු අගයක් ගනී.

(ආ) තොග වෙනස්වීම් සෘණ අගයක් වීම නිසා දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනයට වඩා දළ දේශීය ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය ඉහළ අගයක් ගනී.

(ඇ) වෙළෙඳ අනුපාතය මගින් එල්ල වී ඇති බලපෑම වාසි දායකවීම නිසා මූර්ත ජාතික නිෂ්පාදිතයට වඩා මූර්ත ජාතික ආදායම ඉහළ අගයක් ගනී.

(ඈ) පාද වර්ෂයට සාපේක්ෂව සලකා බලන වසරේ මිල මට්ටම ඉහළ යාම නිසා වර්තන මිලට ද. ජා. නි. ට වඩා ස්ථාවර මිලට ද. ජා. නි. පහළ යයි.

(ඉ) ශුද්ධ අපනයන සෘණ අගයක් ගැනීම නිසා ද. දේ. වි. ට වඩා ද. දේ. නි. පහළ අගයක් ගනී.
(ලකුණු 05)

(III) (අ) විධිමත් සංඛ්‍යා ලේඛන තුළට ප්‍රවේශ නොවන හා වුවමනාවෙන්ම සඟවා තබන ආර්ථික ක්‍රියා නිරීක්ෂණය නොකෙරෙන ආර්ථික ක්‍රියා නම් වේ. මේවා ඇතැම්විට නීති විරෝධී විය හැකිය.

- පදික වෙළෙඳාම, ගෘහ කර්මාන්ත, හේන් ගොවිතැන,
- මත්ද්‍රව්‍ය නිෂ්පාදනය, ගණිකා වෘත්තිය (ලකුණු 03)

(ආ) මෙවැනි ආර්ථික ක්‍රියා නිසා ජාතික ගිණුම් අවතක්සේරු වීමක් සිදු වේ. ජාතික ගිණුම් පිළිබඳ විශ්වාසනීයත්වය පහළ යයි (ලකුණු 02)

(5). (I) (අ)

$$Y = C + I$$
$$Y = 150 + 0.75y + 225$$
$$Y = 375 + 0.75y$$
$$Y - 0.75y = 375$$
$$Y = \frac{375}{0.25}$$
$$Y = 1500$$

(ලකුණු 02)

(ආ)




(ලකුණු 02 )

(II) Y = E

(අ) $Y = C + I + G$

$Y = 150 + 0.75Yd + 225 + 40$

$Y = 150 + 0.75\,(y + 40 - 60) + 225 + 40$

$Y = 415 + 0.75y - 15$

$Y - 0.75Y = 400$

$Y = \dfrac{400}{0.25}$ (ලකුණු 02)

$Y = 1600$

(ආ) W = J

$S + (T - R) = I + G$

$245 + (60 - 40) = 225 + 40$

$265 = 265$ (ලකුණු 01)

$S = -150 + 0.25\,Yd$

$S = -150 + 0.25\,(Y + 40 - 60)$

$S = -150 + 0.25(Y - 20)$

$S = -155 + 0.25\,Y$

$S = -155 + 0.25(1600)$

$S = 245$ (ලකුණු 01)

(III) $K = \dfrac{1}{(1 - MPC)} = \dfrac{1}{(1 - 0.75)} = \dfrac{1}{0.25} = 4$

- $\Delta Y = K \times \Delta I$

  $600 = 4 \times \Delta I$

  $\dfrac{600}{4} = \Delta I$

  $150 = \Delta I$ ආයෝජනය 150 ත් වැඩිකළ යුතුය. (ලකුණු 04)

(IV) (අ)




(ලකුණු 02)

පූර්ණ සේවා නියුක්ති සමතුලිත නිමැවුම් මට්ටම යටතේ තවදුරටත් $E_2$ දක්වා සමාහාර ඉල්ලුම වැඩි වන්නේ නම්, මිල මට්ටමේ ඉහළ යාමක් සිදුවේ. (ලකුණු 01)

(ආ) කුටුම්භයන්ගේ පරිභෝජන ඉල්ලුම.
රජයේ පරිභෝජන ඉල්ලුම.
ආයෝජන භාණ්ඩ සඳහා ඉල්ලුම.
ශුද්ධ අපනයන.
C + I + G +(X – M ) (ලකුණු 02)

(V) වැයකළ හැකි ආදායම.
කුටුම්බ සතු ධනය.
මිල මට්ටම.
පොලී අනුපාතිකය. (ලකුණු 03)

(06).(I) පදනම් මුදල් යනු රටක මුදල් සැපයුමට පාදක වන මහ බැංකුවේ වගකීම් කිහිපයකි. එය මහ බැංකුවේ ශේෂ පත්‍රයේ වගකීම් ඇසුරින් මෙසේ දැක්විය හැකිය.

1. ව්‍යවහාර මුදල් – මහජනයා සතු ව්‍යවහාර මුදල්
- වාණිජ බැංකු සතු ව්‍යවහාර මුදල්
2. මහ බැංකුවේ ඇති වාණිජ බැංකු සතු තැන්පතු.
3. මහ බැංකුවේ ඇති රාජ්‍ය නියෝජිත ආයතන සතු තැන්පතු.

<u>පදනම් මුදල් හා මුදල් සැපයුම අතර සම්බන්ධය</u>

රටක පදනම් මුදල් තොගය මුදල් ගුණකයෙන් වැඩිකළ පසු මුදල් සැපයුම ලැබේ.

මුදල් සැපයුම = පදනම් මුදල් x මුදල් ගුණකය (ලකුණු 04)

(II) අවශ්‍ය සංචිතය $500 \times \frac{20}{100} = 100$

පවතින සංචිතය ( සැබෑ සංචිතය) = 70
ඌන සංචිතය **30**

තැන්පතු ගුණකය $1 / \frac{20}{100} = 5$

එමනිසා ඌන සංචිතය, ගුණකයෙන් වැඩිකර ලැබෙන අගයේ ප්‍රමාණයෙන් තැන්පතු සංකෝචනය කළ යුතුය. එවිට ශේෂ පත්‍රය මෙසේය.

| | | | |
|---|---|---|---|
| තැන්පතු | 350 | මුදල් සංචිතය | 70 |
| | | භාණ්ඩාගාර බිල්පත් | 130 |
| | | ණය හා අත්තිකාරම් | 150 |
| | 350 | | 350 |

(ලකුණු 02)

බහුවිධ තැන්පතු සංකෝචනය යනු බැංකු පද්ධතිය තුළ ඌණ සංචිතයක් පවතින විට එම ඌණ සංචිතය තැන්පතු ගුණකයෙන් වැඩිකර ලැබෙන අගයෙන් ණය හා තැන්පතු පහත දැමීමේ ක්‍රියාවලියයි එනම් ඌන සංචිතය මෙන් තැන්පතු ගුණකයක ප්‍රමාණයෙන් මුදල් සැපයුම පහළ දැමීමේ ක්‍රියාවලියයි.
(ලකුණු 02)

(III)ඒකපණ ණය වෙළෙඳපොළේ ඌන ද්‍රවශීලතාවක් පවතින විට පොලී අනුපාතය ශීග්‍රයෙන් ඉහළට තෙරපීමක් සිදුවන අතර අධි ද්‍රවශීලතාවයක් පවතින විට පහළට තෙරපීමක් සිදුවනු ඇත. මේමගින් ඒකපණ ණය වෙළෙඳපොළේ පොලී අනුපාත උච්ඡාවචනයක් සිදු වේ. (ලකුණු 01)

පොලී අනුපාතික ස්ථායිතාව ඇති කිරිමට ඒකපණ ණය වෙළෙඳපොළ පොලී අනුපාතිකයන් විචලනය වන පරාසය සීමා කිරිම සඳහා මහ බැංකුව ප්‍රති විකුණුම් සහ ප්‍රති මිලදී ගැනුම් අනුපාතික හසුරුවනු ලබයි. (ලකුණු 01)

ප්‍රති මිලදී ගැනුම් අනුපාතිකය මහ බැංකුවේ දෛනික ණය ගැනුම් අනුපාතිකය වන අතර එය ඒක්පණ ණය වෙළෙඳපොළේ පහළ පොලී සීමාව වේ. ප්‍රති විකුණුම් අනුපාතිකය දෛනික ණය දීමේ අනුපාතිකය වන අතර එය ඒක්පණ ණය වෙළෙඳපොළේ ඉහළ පොලී සීමාව වේ මෙම පොලී අනුපාතික පරාසය ඒක්පණ ණය වෙළෙඳපොළේ පොලී අනුපාතික කොරිඩෝව ලෙස සැලකේ. එම පරාසය හැසිරවීම මගින් අන්තර් බැංකු ඒක්පණ ණය වෙළෙඳපොළේ සාමාන්‍ය පොලී අනුපාතිකය ස්ථාවර මට්ටමක පවත්වා ගත හැක. (ලකුණු 02)

(IV) (අ) - මිල හා ආර්ථික ස්ථායිතාවය
- මූල්‍ය ක්‍රමයේ ස්ථායිතාවය (ලකුණු 02)

(ආ) - මූල්‍ය ප්‍රතිපත්තිය මෙහෙය වීම
- විදේශ විනිමය ප්‍රතිපත්තිය මෙහෙයවීම
- නිල විදේශ සංචිත කළමනාකරණය
- ව්‍යවහාර මුදල් නිකුතුව
- මූල්‍ය ආයතන ආරම්භ කිරීමට බලපත්‍ර නිකුත් කිරීම, නියාමනය හා අධීක්ෂණය
- මහ බැංකුවේ ගිණුම් පවත්වාගෙන යන මූල්‍ය ආයතනවලට නිශ්කාපණ පහසුකම් සැලසීම
- රජයේ බැංකුකරු මූල්‍ය උපදේශකයා සහ මූල්‍ය නියෝජිතයා ලෙස කටයුතු කිරීම

(ලකුණු 03)

(V) රටක සමාහාර ඉල්ලුම ප්‍රසාරණය කිරීම සඳහා මූල්‍ය ප්‍රතිපත්තිය යොදා ගන්නා ආකාරය.
1. පොලී අනුපාතය පහත හෙළීම.
2. සංචිත අනුපාතය පහත හෙළීම.
3. විවට වෙළෙඳපොළ ක්‍රියාකාරකම් යටතේ මහ බැංකුව විසින් භාණ්ඩාගාර බිල්පත් මිලදී ගැනීම.

(ලකුණු 03 )

(07).(I) (අ) වෙළෙඳපොළ අසමත් වීම යනුවෙන් අදහස් කරනුයේ සමාජයේ යහපත උදෙසා හිඟ සම්පත් බෙදා හැරීමේ ලා වෙළෙඳපොළ යන්ත්‍රණය අපොහොසත් වීමය. ඒ සඳහා බලපාන හේතු වනුයේ,
1. සම්පත් බෙදියාම අකාර්යක්ෂම වීම.
  - පොදු භාණ්ඩ නොසැපයීම.
  - බාහිරතා
  - අපූර්ණ තොරතුරු
  - අපූර්ණ තරගය
  - පොදු දේපළ සම්පත් අධි භාවිතය
  - සාධක අංසචලතාවය

2. ආදායම් බෙදී යාම අසාධාරණ වීම.
3. ආර්ථික අස්ථායිතාව. (ලකුණු 01 )

ආණ්ඩුව අසමත් වීම යනු වෙළෙඳපොළ යාන්ත්‍රණය අසාර්ථක වන තැන්හිදී එහි අසාර්ථකත්වයන් නිවැරදි කිරීම සඳහා ආණ්ඩුව ආර්ථිකය වෙත මැදිහත් වුව ද එය හේතු කොට ගෙන වෙළෙඳපොළ ක්‍රමයේ පැවැති අසාර්ථක්වයන් තව දුරටත් ගැඹුරට වර්ධනය වීම හෝ පෙර නොතිබූ නව ගැටලු ඇතිවීමේ ප්‍රවනතාවය යි. ආණ්ඩුව අසමත් වීමට පහත හේතු බලපානු ලැබේ.

- ආණ්ඩුවේ ක්‍රියාකාරිත්වයේ දක්නට ලැබෙන දෘඩතාවයන්
- දේශපාලනික ස්වාර්ථය
- ආණ්ඩුවේ ප්‍රතිපත්තිවල අවිදූර දෘෂ්ටිකත්වය
- අපූර්ණ තොරතුරු මත ප්‍රතිපත්ති තීරණය කරා එළඹීම
- සානුබල කෙරෙහි අහිතකර බලපෑම
- පරිපාලන වියදම් ඉහළයාම (ලකුණු 01)

(ආ)

(a). හෝරා ස්ථම්භය = පොදු භාණ්ඩයකි.

- පරිභෝජනය සීමාකල නොහැක.
- පරිභෝජනයේ තරගකාරීත්වයක් නැත.

(b). ඕසෝන් ස්ථරය = ගෝලීය පොදු භාණ්ඩයකි.

- ගෝලීය ප්‍රජාවට ප්‍රතිලාභ හිමිවීම.
- පරිභෝජනය සීමාකල නොහැක.
- පරිභෝජනයේ තරගකාරීත්වයක් නැත.

(c). අධ්‍යාපනය = ශුභ සාධන භාණ්ඩයකි.

- පුද්ගලික ප්‍රතිලාභ අභිබවා බාහිර ප්‍රතිලාභ පැවතීම.

(d). පිහිනුම් තටාකයක් = අර්ධ පොදු භාණ්ඩ

- උපරිම ධාරිතා මට්ටමට ළඟාවන තෙක් පරිභෝජනයේ තරගකාරීත්වයක් නැත.
- පරිභෝජනය සීමාකල හැක.

(e). සාගරයේ සිටින මත්ස්‍යයින් = පොදු සම්පත්

- පරිභෝජනය සීමාකල නොහැක.
- පරිභෝජනයේ තරගකාරීත්වයක් ඇත. (ලකුණු 05)

(II) ප්‍රතිචක්‍රීය (අභිමතානුසාරී) රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තියක් යනු ආණ්ඩුවේ වියදම් හා බදු ස්වයංක්‍රීයව වෙනස්වීමට ඉඩ නොතබා සාර්ව ආර්ථික අරමුණු අත්කර ගැනීම සඳහා ප්‍රතිපත්ති සම්පාදකයන්ට අවශ්‍ය පරිදි ආණ්ඩුවේ වියදම් හා බදු වෙනස් කිරීමේ ක්‍රියාවලිය යි. නැතහොත් ව්‍යාපාර චක්‍රයේ දෝලනයන් සමනය කිරීම සඳහා රාජ්‍ය මූල්‍ය අභිමතය පරිදි හැසිරවීමේ ක්‍රියාවලිය වේ.
(ලකුණු 01)

ප්‍රතිචක්‍රීය රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමට එරෙහිව ඉදිරිපත්වන තර්ක පහත දැක්වේ.

1. හඳුනා ගැනීමේ ප්‍රමාදය.
2. පරිපාලන ප්‍රමාදය.
3. දේශපාලන ස්වාර්ථය.
4. තෙරපුම් ප්‍රතිවිපාකය. (ලකුණු 02)

(III) (අ)

බදු ක්‍රමයේ සාධාරණත්වය යනු ගෙවීම් හැකියාව පදනම් කරගෙන හෝ ප්‍රතිලාභ භුක්තිවිඳින ප්‍රමාණය පදනම් කරගෙන සමානාත්මතාවයක් ඇති වන පරිදි බදු අය කළ යුතු බවයි. සාධාරණත්වය සඳහා පහත කොන්දේසි දෙක ඉටුවිය යුතුය.

1. තිරස් සාධාරණත්වය = සමාන ආර්ථික හැකියාව ඇති අය වෙත සමාන බදුබරක් පතිත කළ යුතු බවයි.

2. සිරස් සාධාරණත්වය = අසමාන ආර්ථික හැකියාව ඇති අය වෙත අසමාන බදුබරක් පතිත කළ යුතු බවයි. (ලකුණු 02)

(ආ) අනුක්‍රමික බදු = බදු පදනම හා බදු අනුපාතය අතර අනුලෝම සම්බන්ධයක් පවතින බදු වර්ග වේ.

- ආදායම් බදු
- දේපළ බදු

ප්‍රතික්‍රමික බදු = බදු පදනම හා බදු අනුපාතය අතර ප්‍රතිලෝම සම්බන්ධයක් පවතින බදු වර්ග වේ.

- තෝරාගත් නිෂ්පාදන බදු

සමානුපාතික බදු = බදු පදනම කුමක් වුවත් අයකරන බදු අනුපාතය ස්ථාවරව පවතින බදු වර්ග වේ.

- එකතුකළ අගය මත බදු (VAT) (ලකුණු 03)

(ඉ) අධි බදු බර යනු භාණ්ඩ මත බදු පැනවීම නිසා සමාජ ශුභ සාධනය අහිමි වී යන ප්‍රමාණයයි.
අධි බදු බරක් ඇති වීමට නම් කොන්දේසි දෙකක් ඉටුවිය යුතුය.
1. බද්ද විතැන් කළ හැකි වීම.
2. බද්ද ගැළපුම් කළ හැකි වීම. (ලකුණු 01)

භාණ්ඩ මත බදු පැනවීම නිසා ඇතිවන අධි බදු බර එම භාණ්ඩයට ඇති ඉල්ලුම් හා සැපයුම් නම්‍යතාව මත පදනම් වේ.
පූර්ණ අනම්‍ය ඉල්ලුමක් පවතින භාණ්ඩයකට බද්දක් පැනවූ විට අධි බදු බරක් ඇති නොවේ.




- අධි බදු බරක් ඇති නොවේ.

පූර්ණ නම්‍ය ඉල්ලුමක් පවතින භාණ්ඩයකට බද්දක් පැනවූ විට අධි බදු බරක් ඇති වේ.




- ABC ප්‍රමාණයෙන් අධි බදු බරක් ඇතිවේ. (ලකුණු 02)

(IV) දේශීය මාර්ග වලින් අයවැය හිඟය මූල්‍යනය කිරීම (ද.දේ. නි. ප්‍රතිශතයක් ලෙස) 3.5%
විදේශීය මාර්ග වලින් අයවැය හිඟය මූල්‍යනය කිරීම (ද.දේ. නි. ප්‍රතිශතයක් ලෙස) 3.4%
(2011 වසරේදී)
(ලකුණු 01)

දේශීය මාර්ග වලින් මූල්‍යනය කිරීමේ ප්‍රතිවිපාක
1. මුදල් සැපයුම ප්‍රසාරණය වීම නිසා උද්ධමනයක් ඇතිවීම.
2. තෙරපුම් ප්‍රතිවිපාකයක් ඇතිවීම.
3. දේශීය වෙළෙඳපොළ පොළී අනුපාතිකය ඉහළ යාම.

විදේශීය මාර්ග වලින් මූල්‍යනය කිරීමේ ප්‍රතිවිපාක
1. විදේශ ණය සේවා කරණ අනුපාතය ඉහළ යාම.
2. විදේශ වත්කම් ඉහළ යාම නිසා මුදලේ විදේශ අගය තාවකාලිකව ඉහළ යාම.
3. දිගුකාලීන වශයෙන් ගෙවුම් ශේෂ ගැටලු මතුවීම. (ලකුණු 01)

(08). (I)

(අ)

| | චීනය | තායිවානය |
|---|---|---|
| ගුවන් විදුලි යන්ත්‍රක් නිපදවීමේ ආවස්ථික පිරිවැය | 10/4 = 2.5 | 5/1 = 5 |
| පරිගණකයක් නිපදවීමේ ආවස්ථික පිරිවැය | 4/10 = 0.4 | 1/5 = 0.2 |

- ගුවන් විදුලි යන්ත්‍ර නිපදවීමේ සාපේක්ෂ වාසි පවතින්නේ චීනයට ය. හේතුව ගුවන් විදුලි යන්ත්‍රයක් නිපදවීමේ ආවස්ථික පිරිවැය සාපේක්ෂ වශයෙන් අඩුය.
- පරිගණක නිපදවීමේ සාපේක්ෂ වාසි පවතින්නේ තායිවානයට ය. හේතුව තායිවානය තුළ පරිගණකයක් නිපදවීමේ ආවස්ථික පිරිවැය සාපේක්ෂ වශයෙන් අඩුය.

(ආවස්ථික පිරිවැය ගණනය කොට සාපේක්ෂ වාසි පවතින රට නම් කොට තිබේ නම් ලකුණු 01 බැගින් උපරිම ලකුණු 02)

(ආ)







චීනය ගුවන් විදුලි යන්ත්‍ර නිෂ්පාදනය මත විශේෂීකරණයක් ඇතිකර ගනී. පූර්ණ විශේෂීකරණය යටතේ චීනය A නිමැවුම් සංයෝගය නිෂ්පාදනය කරයි.

තායිවානය පරිගණක නිෂ්පාදනය මත විශේෂීකරණයක් ඇතිකර ගනී. පූර්ණ විශේෂීකරණය යටතේ තායිවානය B නිමැවුම් සංයෝගය නිෂ්පාදනය කරයි.

(නිෂ්පාදන හැකියා මායිම නිවැරදිව ඇඳ නිවැවුම් සංයෝගය නිවැරදිව දක්වා ඇත්නම් ලකුණු 01 බැගින් ලකුණු 02 යි.)

(ඉ) ගුවන් විදුලි යන්ත්‍ර නිෂ්පාදනය මත විශේෂීකරණය වූ චීනය ගුවන් විදුලි යන්ත්‍ර 100ක් අපනයනය කර පරිගණක 400ක් ආනයනය කළ විට පරිභෝජන සංයෝගය $A^1$ දක්වා විතැන් වේ. ඒ අනුව චීනයේ පරිභෝජන හැකියා මායිම නිෂ්පාදන හැකියා මායිමෙන් දකුණු පසට විතැන්වේ.

පරිගණක නිෂ්පාදනයේ ලා විශේෂීකරණය වූ තායිවානය පරිගණක 400ක් අපනයනය කර ගුවන් විදුලි යන්ත්‍ර 100ක් ආනයනය කළ විට පරිභෝජන සංයෝගය $B^1$ දක්වා විතැන් වේ. ඒ අනුව තායිවානයේ පරිභෝජන හැකියා මායිම නිෂ්පාදන හැකියා මායිමෙන් දකුණු පසට විතැන් වේ.

(පරිභෝජන සංයෝග නිවැරදිව දක්වා පරිභෝජන හැකියා මායිම ඇඳ තිබේ නම් ලකුණු 01 බැගින් ලකුණු 02 යි. )

(ඊ) විනය ගුවන් විදුලි යන්ත්‍ර 1ක් අපනයනය කොට තායිවානයෙන් ආනයනය කරන පරිගණක ප්‍රමාණය 2.5 ත් .5 ත් අතර විය යුතුය.

තායිවානය පරිගණක 1ක් අපනයනය කොට චීනයෙන් ආනයනය කරන ගුවන් විදුලි යන්ත්‍ර ප්‍රමාණය 0.2 ත් 0.4ත් අතර විය යුතුය.

(ලකුණු 02)

(II) (අ) ආදායම් ගිණුමේ, ආදායම් ගෙවීමක්

(ආ) මූල්‍ය ගිණුමේ, දිගුකාලීන රාජ්‍ය ණය ආපසු ගෙවීමකි

(ඉ) වර්තන සංක්‍රාම ගිණුමේ, පෞද්ගලික සංක්‍රාම ගෙවීමකි

(ඊ) සේවා ගිණුමේ ව්‍යාපාරික සේවා ගෙවීමකි

(එක් පිළිතුරකට ලකුණු 01 බැගින් ලකුණු 02 යි)

(III) ආනයන තීරු බද්දක් පැනවීමේ ප්‍රතිඵලයක් වශයෙන් දේශීය වශයෙන් නිෂ්පාදනය කරනු ලබන තරගකාරී භාණ්ඩයකට ආනයනය කරනු ලබන භාණ්ඩයේ මිල ඉහළ යාමේ ප්‍රතිශතයක් තුලින් ලැබෙන ආරක්ෂණය නාමික ආරක්ෂණ අනුපාතිකය. නමින් හැඳින්වේ. නාමික ආරක්ෂණ අනුපාතිකය. තීරු බද්දට පසුව දේශීය භාණ්ඩයේ මිල. ආනයනික භාණ්ඩයේ මිලේ ප්‍රතිශතයක් ලෙස ප්‍රකාශ කළ හැක.

ආනයන තීරු බද්දක් පැනවීමේ ප්‍රතිඵලයක් වශයෙන් දේශීය වශයෙන් නිෂ්පාදනය කරනු ලබන තරගකාරී භාණ්ඩයකට ආනයනය කරනු ලබන භාණ්ඩයේ මිල ඉහළයාමේ ප්‍රතිශතයක් තුලින් ලැබෙන ආරක්ෂණය නාමික ආරක්ෂණ අනුපාතිකය නමින් හැඳින්වේ. නාමික ආරක්ෂණ අනුපාතිකය තීරු බද්දට පසුව දේශීය භාණ්ඩයේ මිල ආනයනික භාණ්ඩයේ මිලේ ප්‍රතිශතයක් ලෙස ප්‍රකාශ කළ හැක.

ආනයන තීරු බද්දට පසුව දේශීය තරගකාරී නිෂ්පාදනයක එකතුකල අගයත් , තීරුබදු පැනවීමට පෙර (නිර්බාධ වෙළෙඳාම යටතේ) දේශීය නිෂ්පාදිතයේ එකතු කළ අගයත් අතර වෙනස , තීරුබදු පැනවීමට පෙර දේශීය නිෂ්පාදිතයේ එකතු කළ අගයේ ප්‍රතිශතයක් ලෙස දැක්වීම සඵල ආරක්ෂණ අනුපාතිකය වේ.

$$\text{සඵල ආරක්ෂණ අනුපාතිකය} = \frac{\text{තීරු බද්දට පසු දේශීය නිමැවුමේ එකතු කළ අගය} - \text{නිර්බාධ වෙළෙඳාම යටතේ එකතු කළ අගය}}{\text{නිර්බාධ වෙළෙඳාම යටතේ එකතු කළ අගය}} \times 100$$

(එක් කරුණකට ලකුණු 01 බැගින් උපරිම ලකුණු 02)

(IV) <u>**ස්ථාවර විනිමය අනුපාතිකයේ වාසි -**</u>

- නිතර නිතර විනිමය අනුපාතය උච්ඡාවචනය වීමේ අවදානම ඉවත් වීම නිසා ජාත්‍යන්තර වෙළෙඳාම ප්‍රවර්ධනයට හේතු වේ.
- අපනයනවල තරගකාරීත්වය ආරක්ෂා කර ගැනීම සඳහා නිෂ්පාදන පිරිවැය සාපේක්ෂව පහළ මට්ටමක පවත්වා ගැනීමට මේ යටතේ බල කරන බැවින් දේශීය ආර්ථික කළමනාකරණය සම්බන්ධයෙන් දැඩි විනයක් මේ මගින් ඇති කරයි.
- ජාත්‍යන්තර ප්‍රාග්ධන ආයෝජනයන් හා ණය අරමුදල් හුවමාරු කරන්නන්ට හිතකර බලපෑම් ඇති වීම.
- විනිමය අනුපාතිකයේ අපේක්ෂිත වෙනස්වීම් පදනම් කරගත් සමපේක්ෂණ ක්‍රියාවන් ස්ථාවර විනිමය අනුපාතිකය යටතේ සිදු නොවේ.

<u>**ස්ථාවර විනිමය අනුපාතිකයේ අවාසි -**</u>

- බාහිර සමතුලිතතාව වෙනුවෙන් අභ්‍යන්තර සමතුලිතතාවය කැප කිරීමට සිදුවේ.
- ස්ථාවර විනිමය අනුපාතය තුළ අධි හෝ ඌණ තක්සේරුවක් ඇතිවුවහොත් නිරන්තරයෙන් ගෙවුම් ශේෂ අසමතුලිතතාවයකට මුහුණ පෑමට සිදුවේ.
- ස්ථාවර විනිමය අනුපාතිකය ක්‍රමය පවත්වා ගෙන යාම සඳහා මූල්‍ය අධිකාරීන්ට විදේශ විනිමය විශාල සංචිතයක් පවත්වාගෙන යාමට සිදුවීම.

- ප්‍රමාණවත් විදේශ විනිමය සංචිතයක් මූල්‍ය අධිකාරීන් සතුව නොතිබුණු අවස්ථාවක ගෙවුම් ශේෂ හිඟයක් පැවතුන හොත් දැඩි ආරක්ෂණවාදී ක්‍රියා මාර්ග අනුගමනය කිරීමට සිදුවීම හා එමගින් සමාජ ශුභ සාධනයට හානි සිදුවීම.

**<u>නාමික විනිමය අනුපාතිකයේ වාසි</u>**

- විදේශ විනිමය සඳහා වූ ඉල්ලුම හා සැපයුම සමාන කෙරෙන සමතුලිත විනිමය අනුපාතිකයක් බැවින් අධි හෝ ඌණ තක්සේරුවක් ඇති නොවේ.
- තාත්වික විනිමය අනුපාතිකයක් බැවින් ගෝලීය සම්පත් විකල්ප භාවිතයන් අතර වඩාත් කාර්යක්ෂම ආකාරයට බෙදී යයි.
- බාහිර සමතුලිතතාව පවත්වා ගැනීම සඳහා අභ්‍යන්තර සමතුලිතය කැප කිරීමට සිදු නොවන බැවින් නම්‍ය විනිමය අනුපාතිකයක් පවතින විට ආර්ථික කළමනාකරණය වඩා පහසු වනු ඇත.
- මූල්‍ය ප්‍රතිපත්තිය බාහිර සාධකවල බලපෑමෙන් මුළුමනින්ම නිදහස් බැවින් දේශීය ආර්ථිකය ශක්තිමත් කිරීමට එය නිදහසේ යොදා ගත හැකි වීම.
- විනිමය අනුපාතිකය පවත්වා ගැනීම සඳහා විශාල විදේශ විනිමය සංචිත පවත්වා ගෙන යාම අවශ්‍ය නොවේ.

**<u>නාමික විනිමය අනුපාතිකයේ අවාසි</u>**

- නිරන්තර උච්ඡාවචනය වීම නිසා ජාත්‍යන්තර වෙළෙඳාමේ ප්‍රවර්ධනයට බාධක ඇති කරයි.
- සමපේක්ෂණ ක්‍රියා ධෛර්යමත් වීම නිසා විනිමය අනුපාතිකය දැඩි ලෙස උච්ඡාවචනය වීමට හේතු වේ.
- සාර්ව ආර්ථික විනයක් පවත්වා ගෙන යාමට පෙළඹීමක් ඇති නොවේ.
- ආයෝජකයින්ට හා ණය අරමුදල් ගනුදෙනුකරුවන්ට අවාසි ඇති කරයි.

(එක් එක් විනිමය අනුපාත ක්‍රමයේ වාසි හා අවාසි 02 බැගින් දැක්වීමට උපරිම ලකුණු 04)

(V)

- දකුණු ආසියානු නිදහස් වෙළෙඳ ගිවිසුම. (SAFTA)
- දකුණු ආසියානු කලාපීය සහයෝගිතා සංවිධාන. (SAARC)
- බහු අංශික තාක්ෂණික හා ආර්ථික සහයෝගිතාවය උදෙසාවන බෙංගාල බොක්ක ආශ්‍රිත රටවල මූලිකත්වය. (BIMSTEC)
- ආසියානු ශාන්තිකර ආර්ථික සහයෝගිතාවය. (APEC)
- ඉන්දියානු සාගර කවය කලාපීය සහයෝගිතාවය සඳහා සංවිධානය. (IORARC)

(ලකුණු 02යි.)

(09).(I) කාලයත් සමග ආර්ථිකයේ විභව නිමැවුම හෝ නිෂ්පාදන ධාරිතාව ප්‍රසාරණය වීම ආර්ථික වෘද්ධිය යි. එය ඉල්ලුම, සැපයුම සහ කාර්යක්ෂමතාවය යන සාධකයන්ගේ අන්තර් ක්‍රියාකාරිත්වය තුලින් හට ගන්නා ගතික ක්‍රියාවලියකි.

වෘද්ධිය සඳහා සුදුසු ක්‍රියා මාර්ග

- ඉතුරුම් හා ආයෝජන දිරි ගැන්වීම.
- විදේශ ආයෝජන දිරිමත් කිරීම.
- යටිතල පහසුකම් දියුණු කිරීම.
- මානව ප්‍රාග්ධනය සංවර්ධනය සඳහා ආයෝජනය.
- දේපොළ හිමිකම් ආරක්ෂා කිරීම.
- දේශපාලන ස්ථාවරත්වය.
- අබාධ වෙළෙඳාම.
- පර්යේෂණ සහ සංවර්ධන වැය ඉහළ නැංවීම.
- බදු පහත හෙළීම සහ නියාමන හරණය.

(ලකුණු 04)

(II) ආර්ථිකයේ සෑම අංශයකම පැතිරුණු ඉහළ තිරසාර වර්ධනයක් ළඟාකර ගැනීම සර්ව සහභාගිත්ව ආර්ථික වෘද්ධිය යන්නෙන් අදහස් වේ.
සර්ව සහභාගිත්ව ආර්ථික වෘද්ධිය මගින්, ආර්ථික සංවර්ධන ක්‍රියාවලියෙන් ඈත්ව සිටින සමාජ කොටස්වලට ද ආර්ථික සංවර්ධන ක්‍රියාවලියට එකතුවීමට ඉඩ සලසනු ඇත. ඒ අනුව සමාජයේ සෑම පුරවැසියෙකුට ම ආර්ථික වර්ධනයට දායක වීමට සහ එමගින් ප්‍රතිලාභ ලැබීමට ඉඩ සැලසේ.

සර්ව සහභාගිත්ව වෘද්ධිය යන්නෙන් ආදායම් පුනර් ව්‍යාප්තියක් වීම යන්න පමණක් අදහස් නො කෙරේ. එමගින් අවධාරණය කෙරෙනුයේ පුද්ගලයන්ට ආර්ථික කටයුතුවලට දායක වීමට ඇති හැකියාව වැඩි දියුණු කිරීම සහ රැකියා අවස්ථා ජනනය කිරීම සඳහා සුදුසු ව්‍යාපාරික පරිසරයක් ගොඩනැංවීමට වන අතර එය ආදායම් පුනර්ව්‍යාප්ති සංකල්පයට වඩා වෙනස්ය.

දිළින්දන්ට හිතකර ආර්ථික වෘද්ධිය යනු දිළිඳු අයගේ මධ්‍යයන ආදායම දිළිඳු නොවන අයගේ මධ්‍යයන ආදායමට වඩා වැඩි වේගයකින් ඉහළ යන ආකාරයේ වෘද්ධියකි. මෙමගින් ආදායම් විෂමතාව අඩුවේ. වෘද්ධිය නිසා දිළින්දන්ගේ ප්‍රතිලාභ වැඩි වේ නම් එය දිළින්දන්ට හිතකර ආර්ථික වෘද්ධිය වේ.

(ලකුණු 04)

(III) මානව සංවර්ධනය යනු මානව හැකියාවන් සහ කාර්යයන් ප්‍රසාරණය වන පරිදි රටක ජනතාවගේ තෝරා ගැනීමේ පරාසය පුළුල් වීමේ ක්‍රියවලිය යි.
මානව සංවර්ධනය, ප්‍රධාන මානයන් තුනක් යටතේ සලකා බැලේ

- දීර්ඝ, සෞඛ්‍ය සම්පන්න ජීවිතයක් ගත කිරීම.
- දැනුම.
- යහපත් ජීවන තත්වය.

තිරසාර සංවර්ධනය යනු අනාගත පරම්පරාවන්ගේ අවශ්‍යතා ඉටුකර ගැනීමට බාධා නොවන පරිදි වර්තමාන පරපුර විසින් තම අවශ්‍යතා සපුරා ගැනෙන ක්‍රියාවලිය වේ. එහි පැතිකඩ තුනකි.

- ආර්ථික සංවර්ධනය.
- සමාජ සංවර්ධනය.
- පරිසර සුරක්ෂිතතාව.

(ලකුණු 04)

(IV) අ

| වර්ෂය | ළමා යැපුම් අනුපාතය | වැඩිහිටි යැපුම් අනුපාතය | මුළු යැපුම් අනුපාතය |
|---|---|---|---|
| 2001 | 40.7 | 14.3 | 55.0 |
| 2006 | 37.4 | 16.2 | 53.6 |
| 2011 | 35.3 | 19.3 | 54.6 |

(ලකුණු 02)

ආ

- ශ්‍රම සැපයුම පහළ යාම.
- ඉතුරුම් හා ආයෝජන පහළ යාම.
- රාජ්‍ය මූල්‍ය දුෂ්කරතාවලට මුහුණ දීමට සිදුවීම.
- රාජ්‍ය ණය ඉහළ යාම.
- ආදායම පහළ යාම.
- සෞඛ්‍ය සේවා සඳහා අධික පිරිවැයක් දැරීමට සිදුවීම.

මෙකී සමාජ ආර්ථික ගැටලුවලට විසඳුම් ලෙස පහත සඳහන් යෝජනා ඉදිරිපත් කළ හැකිය.

- වැඩකරන අවුරුදු ගණන වැඩිකිරීම
- විශ්‍රාම වැටුප් ප්‍රතිසංස්කරණ දියත් කිරීම
- සෞඛ්‍ය ක්ෂේත්‍රය දියුණු කිරීම.

- සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ සැපයීම.
- ශ්‍රම වෙළෙඳපොළ ප්‍රතිසංස්කරණ.
- අනෙකුත් ව්‍යාපාරික ප්‍රතිපත්ති.

(ලකුණු 04)

(V) බහුමාන දරිද්‍රතා දර්ශකය ගණනය කරනුයේ ජනගහන දරිද්‍රතා දර්ශකය සහ විහීනතා තීව්‍රතා දර්ශකයේ සාමාන්‍ය අගය යන සාධක දෙක එකිනෙකට ගුණ කිරීමෙනි. එනම්,

බහුමාන දරිද්‍රතා දර්ශකය = ජනගහන දරිද්‍රතා දර්ශකය x විහීනතා දර්ශකය

(ලකුණු 02)

(10) I .(අ) මුල් වසර 10 තුළ 8% ක සාමාන්‍ය වාර්ෂික ආර්ථික වෘද්ධියක් අත්කර ගැනීම හා අනතුරුව 9% - 10% ආර්ථික වෘද්ධියක් අත්කර ගැනීම.
ඉදිරි වසර 10 සඳහා ආයෝජන මට්ටම දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස 32% සිට 38% තරම් ප්‍රමාණයක පවත්වා ගැනීම.

(එක් කරුණකට ලකුණු 1 බැගින් ලකුණු 02)

(ආ) 2007 සිට 2011 දක්වා වූ මුල් වසර පහ තුළ ශ්‍රී ලංකාවේ සාමාන්‍ය ආර්ථික වර්ධන වේගය 6.5 % පමණ වූ අතර එම කාල පරිච්ඡේදයේ අවසාන දෙවසර තුළ 8% ක ඉලක්කය වෙත ළගා වී ඇත.

(ලකුණු 01)

2007 සිට 2011 කාලය තුළ ආයෝජන අනුපාතය දළ දේශීය නිෂ්පාදනයේ ප්‍රතිශතයක් ලෙස 24.4 ත් 29.9 ත් අතර විය. ඉලක්ක මට්ටමට ළගා වී නැතත් සතුටුදායක ප්‍රවනතාවයක් පවතී.

(ලකුණු 01)

(ඉ)

- උග්‍ර වෙමින් පවතින ගෙවුම් ශේෂ අර්බුදය.
- රුපියල ක්ෂය වීම.
- ණය බර වේගයෙන් ඉහළ යාම.
- අයවැය මත පීඩනය ඉහළ යාම.
- පෞද්ගලික ආයෝජන මන්දගාමී වීම.
- උද්ධමන පීඩනය හිස එසවීම්.
- කාලගුණික බලපෑම් හමුවේ කෘෂි කර්මය හා බල ශක්තියේ පසුබෑම්.

(ලකුණු 03)

II (අ). ප්‍රාග්ධන හිඟය යනු ආයෝජනය හා දේශීය ඉතිරි කිරීම් අතර පරතරයයි.

- විදේශ ඍජු ආයෝජන.
- විදේශ ණය හා ආධාර.

(ලකුණු 02)

(ආ) පසුගිය වසර වල ශ්‍රී ලංකාව වෙත ගලා එන විදේශීය ඍජු ආයෝජන අස්ථාවරභාවයක් පෙන්නුම් කළ ද
2011 වසරේ දී එහි යහපත් තත්වයක් පෙන්වයි. විදේශීය ඍජු ආයෝජනයන් ගලා ඒම්
2010 එක්සත් ජනපද ඩොලර් 516
2011 එක්සත් ජනපද ඩොලර් 1066

(ලකුණු 01)

කෙසේ නමුත් ඉන්දියාව, වියට්නාමය, චීනය වැනි රටවලට ගලා එන විදේශීය ඍජු ආයෝජන ප්‍රමාණ සමඟ සසඳන විට මෙරටට ගලා එන ආයෝජන පහළ මට්ටමක පවතී.

(ලකුණු 01)

(ඉ)

- යටිතල පහසුකම් වල දුර්වලතා.
- විදුලි බල ගැටලු
  - (නිරන්තර විදුලිබලය ඇන හිටීම)
  - 80% ක් විදුලිය ලබා ගනුයේ විදුලි උත්පාදන යන්ත්‍ර වලිනි.
  - ස්ථාවර වත්කම් වලින් 12%ක් පමණ වැය වනුයේ විදුලි ජනන යන්ත්‍ර මිලදී ගැනීමටය.
- මූල්‍ය පහසුකම් සඳහා ඇති සීමිත ඉඩකඩ හා අධික පිරිවැය වියදම්.
- සාර්ව ආර්ථික අස්ථායිතාව.
- ශ්‍රමය යොදා ගැනීම පිළිබඳ දැඩි රෙගුලාසි.
- ඉහළ බදු බර.
- යහපාලනය බිඳවැටීම.
- දේශීය වෙළෙඳපොළ කුඩා වීම.
- පෞද්ගලික විදේශීය ආයෝජන පිළිබඳ රාජ්‍ය ප්‍රතිපත්තිවල දක්නට ලැබෙන අවිනිශ්චිතතාව. (ඇපලෝ රෝහල, පෙල් සමාගම, ශ්‍රී ලංකා ගුවන් සේවය පිළිබඳ අත් දැකීම.)
- නිෂ්පාදන පිරිවැය ඉහළ යාම.

(ලකුණු 03)

(III) (අ) සමස්ත දරිද්‍රතාව අඩු වී ඇත.

ආංශික හා ප්‍රාදේශීය වශයෙන් දරිද්‍රතාවයේ විෂමතා පවතී.

| අංශය | 1990/1991 | 1995/1996 | 2002 | 2006/2007 | 2009/2010 |
|---|---|---|---|---|---|
| ග්‍රාමීය | 29.4 | 30.9 | 24.7 | 15.7 | 9.4 |
| නාගරික | 16.3 | 38.4 | 7.9 | 6.7 | 5.3 |
| වතු | 20.5 | 14.0 | 30.0 | 32.0 | 11.4 |
| ශ්‍රී ලංකාව | 26.1 | 28.8 | 22.7 | 15.2 | 8.9 |

(ලකුණු 02)

(ආ) සමාජ ආරක්ෂණ ජාල වැඩසටහන්

- ජන සවිය
- සමෘද්ධිය

අඩු ආදාම් ලාභීන්ට සංක්‍රාම ලබා දීම

- ආහාර මුද්දර
- මහ පොළ ශිෂ්‍යාධාර

සමාජ ආරක්ෂණ රැහැන් වැඩසටහන්

- සුරක්ෂම මූල්‍ය
- කාන්තාවන් සවිබල ගැන්වීම

ප්‍රාදේශීය සංවර්ධන වැඩහටහන්

- පුබුදමු වෙල්ලස්ස
- උතුරු වසන්තය
- නැගෙනහිර නවෝදය

ජාතික මට්ටමේ වැඩසටහන්

- මග නැගුම
- ගම නැගුම
- ගැමි දිරිය/දිවි නැගුම
- නැණ සල

(ලකුණු 02)

(ඉ) සමෘද්ධි වැඩසටහනේ දුර්වලතාවයන්

- ප්‍රතිලාභ තේරීම නිවැරදිව ඉලක්ක ගත කොට නොමැත.
  (රටේ දිළිඳු ජනගහන ප්‍රතිශතය 8.9% ක් ලෙස වාර්තා වුව ද ජනගහනයෙන් 30% ක් සමෘද්ධි ආධාර ලබයි.)
- ප්‍රතිලාභීන් තේරීමේ දී දේශපාලන අභිනතියක් පැවතීම.
- ආයතනික ව්‍යුහයේ අඩුපාඩු. (අති විශාල පරිපාලන ව්‍යුහය නිසා අධික වියදම් දැරීමට සිදුවීම.)
- සමෘද්ධි වැඩසටහනේ විවිධ ව්‍යාපෘති අතර සම්බන්ධීකරණය දුර්වලවීම.
- වැඩසටහන තිරසාර ලෙස පවත්වා ගෙනයාමේ හැකියාව දුර්වල වීම. (රාජ්‍ය අනුග්‍රහය මත යැපීම)
- පරාධීන සංස්කෘතියක් නිර්මාණය වීම.

(ලකුණු 02)